රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ: 05/2011

මගේ අංකය: PSC/EST/1/7/1/2011
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
අංක 177
නාවල පාර
නාරාහේන්පිට
2011 දෙසැම්බර් 13 දින

සියළුම අමාත්‍යාංශලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත

**<u>රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පරිපාලන කාර්යයන් පිළිබඳ බලතල පැවරීම</u>**

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිශ්චිත බලතල අවස්ථාවෝචිත පරිදි අමාත්‍යාංශ ලේකම්වරුන්ට සහ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට පවරනු ලැබ ඇති 2011 නොවැම්බර් 25 දාතමින් යුත් අංක:1733/52 ගැසට් නිවේදනයට ඔබේ අවධානය යොමු කරනු ලැබේ..

02. රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත පැවරී ඇති බලතල සම්බන්ධ පරිපාලන කාර්යයන්, කොමිෂන් සභාවේ නියෝග සහ ඒ මගින් සපයනු ලබන මහ පෙන්වීම්වලට අනුකූලව ක්‍රියාත්මක කිරීම සඳහා පහතින් දක්වා ඇති බලධාරීන් වෙත මෙයින් පවරනු ලැබේ.

I)

| බලතල පැවරීමට යටත්වන සේවාවන්/නිලධාරීන් | පරිපාලන බලතල පරවනු ලබන බලධාරීන් |
|---|---|
| -ශ්‍රී ලංකා පරිපාලන සේවය<br>-ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය<br>-ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවය<br>-ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය | රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්/ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලැබ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන අතිරේක ලේකම්වරයෙකු. |
| -ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | භාණ්ඩාගාරයේ ලේකම් විසින් නම් කරනු ලැබ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයෙකු |
| -ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවය | ක්‍රමසම්පාදන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්/ අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලැබූ, අතිරේක ලේකම් තනතුරට වඩා පහළ තනතුරක නොවන, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන නිලධරයෙකු |
| -ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය | අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්/ අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලැබ, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන අතිරේක ලේකම්වරයෙකු |
| -ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය | කෘෂිකර්ම විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්/ අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලැබ, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන අතිරේක ලේකම්වරයෙකු |

| | | |
|---|---|---|
| | -ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවය | පශු සම්පත් සංවර්ධන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්/ අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලැබ, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන අතිරේක ලේකම්වරයෙකු |
| | -ශ්‍රී ලංකා දේශීය වෛද්‍ය සේවය | දේශීය වෛද්‍ය විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්/ අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලැබ, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන අතිරේක ලේකම්වරයෙකු |
| II) | i. දිප ව්‍යාප්ත සේවාවන්ට අයත් නොවන, අංක: 2006/06 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ II) ඇමුණුම (හි අර්ථනිරූපණය කර ඇති ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධරයන් සහ අංක: 2006/06 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ II) ඇමුණුම (හි අර්ථනිරූපණය කර ඇති තෘතීයික මට්ටමේ අධි ශ්‍රේණියේ/විශේෂ ශ්‍රේණියේ නිලධරයන් | අදාළ අමාත්‍යාංශයේ ලේකම්/ අදාළ අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලැබ, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන අතිරේක ලේකම්වරයෙකු. |
| | ii. දිප ව්‍යාප්ත සේවාවන්ට අයත් නොවන සහ අමාත්‍යාංශයක් යටතේ නොවන, අංක: 2006/06 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (ඇමුණුම II )හි අර්ථනිරූපණය කර ඇති ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධරයන් සහ අමාත්‍යාංශයක් යටතේ නොවන , අංක: 2006/06 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (ඇමුණුම II ) හි අර්ථනිරූපණය කර ඇති තෘතීයික මට්ටමේ අධි ශ්‍රේණියේ/විශේෂ ශ්‍රේණියේ නිලධරයන්. | අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා |
| III) | අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය යටතේ වන ජාතික පාසල්වලට හෝ ආයතනවලට අයත් ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I පන්තියේ නිලධරයන් සහ ජාතික පාසල්වල විදුහල්පතිවරුන් | අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් / අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලැබ, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන අතිරේක ලේකම්වරයෙකු |
| IV) | ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරී සේවයේ අධි පන්තියේ නිලධාරීන් | ස්වදේශ කටයුතු විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් /අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලැබ, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන අතිරේක ලේකම්වරයෙකු |
| V) | සහකාර පොලිස් අධිකාරී සහ ඊට ඉහළ නිලයන් | රාජ්‍ය ආරක්ෂක විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් |

03) මීට අමතරව ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ නිලධරයන්ගේ සේවා ව්‍යවස්ථා සැකසීම, කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම සහ සියළු පොදු විභාග පැවැත්වීමට අදාළ කටයුතු රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් වෙත පවරනු ලැබේ.

**රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි**

ටී.එම්.එල්.සී. සේනාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.